## 3. වතු ලැයිස්තුගත කිරීමේ ක්‍රමවේදය

ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති සියළුම වතු 2013 අගෝස්තු මාසයේ ලැයිස්තුගත කරන ලදී. ප්‍රථමයෙන් ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වතු පිහිටා ඇද්ද යන්න ග්‍රාම නිලධාරින්ගෙන් තහවුරු කිරීමෙන් පසු වතු පිහිටා ඇති ග්‍රාම නිලධාරින්ට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අනුයුක්ත කර ඇති ප්‍රාදේශිය සංගණන නිලධාරින් වන සංඛ්‍යාලේඛන නිලධාරින් / සංඛ්‍යාලේඛන සහකාර විසින් වතු ලැයිස්තු ගත කිරීම පිළිබඳව පුහුණුවක් ලබා දෙන ලදි. ඉන් පසු සති තුනක කාලයක් තුළ වතු ලැයිස්තු ගත කිරීමේ ක්ෂේත්‍ර කටයුතු ප්‍රාදේශිය සංගණන නිලධාරින්ගේ සහ දිස්ත්‍රික් අංශ ප්‍රධානින්ගේ අධීක්ෂණය යටතේ සිදුකරන ලදී.

ලැයිස්තු ගත කිරීමේ කටයුතු අවසන් වූ පසු ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමෙන් ලැයිස්තු ගත කරන ලද වතු පිළිබඳ මූලික තොරතුරු ඇතුලත් සාරාංශ වාර්තාවක් සකස්කර ප්‍රාදේශිය සංගණන නිලධාරින්ට ලබා දෙන ලදී. එම වාර්තා පදනම් කරගෙන ප්‍රාදේශිය සංගණන නිලධාරින් විසින් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් එම තොරතුරු සාරාංශ ගතකොට දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන්ට ලබාදෙන ලදී. එම වාර්තා පදනම් කොට දිස්ත්‍රික් අංශ ප්‍රධානීන් මගින් දිස්ත්‍රික්කය තුළ ලැයිස්තු ගත කරන ලද වතු පිළිබඳ මූලික සංඛ්‍යාති ඇතුලත් සාරාංශ වාර්තාවක් සකස්කර ප්‍රධාන කාර්යාලයට ලබා දෙන ලදී. එම දිස්ත්‍රික්ක සාරාංශ වාර්තාව පාදක කොටගෙන මෙම වතු ලැයිස්තු ගත කිරීම පිළිබඳ වාර්තාව සකස් කර ඇත.